ප්‍රඥාවන්තයින්හට නැණ පහන් දල්වන්නට

# ධම්ම චින්තා



පූජ්‍ය අලව්වේ අනෝමදස්සි ස්වාමීන් වහන්සේ

ප්‍රඥාවන්තයින්හට නැණ පහන් දල්වන්නට

# ධම්ම චින්තා

පූජ්‍ය අලව්වේ අනෝමදස්සි ස්වාමීන් වහන්සේ

# ධම්ම චින්තා

පූජ්‍ය අලව්වේ අනෝමදස්සි ස්වාමීන් වහන්සේ

---

ප්‍රථම මුද්‍රණය - 2017 නිකිණි මස
දෙවන මුද්‍රණය - 2017 බිනර මස

---

ISBN: 978-955-38358-3-3

---

පොත් පිළිබඳ සියළු විමසීම්
077-0136809 - කුෂාන් මහතා, කැකිරාව
071-0548449 - තරංග මහතා, මාතලේ
071-6186910 - බුද්ධික මහතා, නාරම්මල
070-3070758 - රසංක මහතා, හොරණ/බත්තරමුල්ල
077-3818758 - ධර්මතුංග දවුන්ඩසේකර මහතා, මාතලේ
Facebook:
www.fb.com/AlawweAnomadassiThero/
Email: alawweanomadassithero@gmail.com

රෑනකෙටුවගල ආරණ්‍ය සේනාසනය,
ඇට්ටපොල වත්ත, වදේමඩ, ඕවිලිකන්ද, මාතලේ

---

## පිදුම

මාගේ ශාස්තෘ වූ තිලෝගුරු
බුදුරජාණන් වහන්සේටත්,

සුපිරිසිදු බුදුවදන මෙය යැයි මඟ
එළිකරමින්

මා හට පැවිදි උපසම්පදාව ලබාදුන්
ගුරුදෙවිදුන්ටත්,

ගෞතම සසුන් ලැදි ශ්‍රාවක
ශ්‍රාවිකාවන්ටත්,

ගෞරවයෙන් පිදෙන උපහාරයකි.

- ❖ තථාගත ධර්මය මනු ලොව පවතින යුගයක ප්‍රඥාවන්ත මිනිසත් බවක් ලැබ තරුණ විය තුලදීම ඒ දහම උදෙසාම ජීවිතය කැපකිරීම කෙතරම් භාග්‍යයක්ද?

- ❖ තථාගත ධර්මය පවතින යුගයක ඒ ගම්භීර ධර්මය තුලින් සැබෑම දහම් මග විවර කරගත් මහා යතිවරයාණන් වහන්සේලා ආදර ගෞරවයෙන් යුතුව ඇසුරු කරන්න ලැබීම කොතරම් භාග්‍යයක්ද?

- ❖ තථාගත ධර්මය නමින් පැවතගෙන ආ විවිධ දෘෂ්ටි මතවාද පවතින යුගයක ඒ පිරිසිදු දහමම ඇසන්නට ලැබීම කොතරම් භාග්‍යයක්ද?

- ❖ සැබෑවටම ඒ පිරිසිදු ගම්භීර ධර්මය ප්‍රඥාවන්තයෙක් වටහා ගන්නේ නම් අනෙකුත් සියලු දෘෂ්ටි මතවාද වල ඇති හිස් බව හා මුලාවන ස්වභාවයන් තේරුම් ගෙන ඒ දෘෂ්ටි මතවාද දරන්නන් ඉදිරියේ මෝඩයෙක් වගේ වාසය කිරීම ආශ්චර්යයි.

❖ ප්‍රඥාවන්තයන්ටම පමණක් ගෝචර වන ජීවිතය ඇතුලින් අත්දකින්න තිබෙන අතක්කාවචර වූ තථාගත ධර්මය මෝඩයන් සමඟ වාද විවාද කිරීමත් මෝඩ අයට පැහැදිලි කර දීමත් ගඟකට ඉනි කපන්නාක් මෙනි.

❖ ධර්මයට කැමති ධර්මය හොයන ප්‍රඥාවන්තයින් සමඟ පමණමයි මේ දහම කථාකල යුත්තේ එසේ නොවුනහොත් තමනුත් ප්‍රමාද වී ඒ පිරිස දහමට ගරහා කරල බොහෝ අකුසලුත් රැස්කර ගන්නවා.

❖ ගිහි පැවිදි බොහෝ උදවිය තමන්ට ලාභයක් පිණිසමයි තව කෙනෙක් ඇසුරු කරන්නේ. ධර්මය ලබාගැනීමේ අදහස තිබෙන්නෙ ඉතාම සුළු පිරිසකට පමණි.

❖ තමන් කැමති දේ ඒ ආකාරයෙන් සිදු නොවුන විට, තමන්ගේ සිතට එන සිතුවිලි ක්‍රියාත්මක කරන්නේ මදකිපුන හස්තියෙක් වගෙයි. ඒ කරන, කියන, සිතන

දේ වලින් තමන්ට විඳවීම පිණිස රැස්වෙන දේ ගැන හිතන්නෙ නැහැ.

❖ කර්මය තමන්ගේ උරුමය, දෑවැද්ද කියල සිතන කෙනා සිතට දාසයෙක් වෙන්නෙ නැහැ. තමන් ගරු කරන කල්‍යාණ මිතුරන්ගෙන් විමසනවා. ඒ වචනයට ගරු කරනවා. ඊට අනුව කටයුතු කරනවා.

❖ මේ හිත දමනය කිරීම හරිම දුෂ්කරයි. තථාගත දහම තුලින් ඇතිකරගත් නුවණ මුල්කරගෙන චිත්තානුපස්සනාව තුලම වාසය කරන විටයි සිත දමනය කල හැකි වන්නේ.

❖ චිත්තානුපස්සනාව තුල වාසය නොකරන කෙනාගේ ජීවිතය රූකඩයක් වගෙයි. සිත විසින් ඒ රූකඩය නටවනවා. කරපු දේවල් ගැන සිතන විට ඉතිරි වන්නෙ පසුතැවීම විතරයි.

❖ ඇත්තෙන්ම මේ තථාගත ධර්මය යමෙක් තේරුම්ගෙන, එය ජීවිතය තුලින් අත්දකිනවා නම්

විෂම ලෝකය තුල සතුටින් ජීවත් වන්න පුළුවනි. එසේ නොවුන ජීවිතය නිතරම කැලඹිලා තියෙන්නෙ හරියට බොර වුන මඩ වලක් වගෙයි. ගම්භීර තථාගත ධර්මය පමණක් නොව හොඳ නරකවත් තේරුම් ගන්න අමාරුයි.

❖ ලාභසත්කාර කීර්ති ප්‍රශංසා එන විට මේ සිත් ඒවාට ගිජුවෙලා යන්නෙ මඩවලේ සිටින මී හරක් වගෙයි. ඒ සිත දමනය කිරීම හරිම දුෂ්කරයි. ඒවාට යට වූ සිතට දහම දැකීම හරිම දුෂ්කරයි. මේ ලාභසත්කාර කීර්ති ප්‍රශංසා වලට නින්දා වේවා !

❖ නින්දා ගැරහිලි දුක දොම්නස එන විට පෘථග්ජන ජීවිතය එය දරාගන්න බැරිව වැලපෙනවා. නමුත් ජීවිතයේ ඇත්ත හොයන භික්ෂුව ඒ තුලින් ධර්ම මාර්ගය තුලටම පිවිසෙනවා.

❖ ආත්මීය වැඩපිලිවෙලකින් තොර මේ ජීවිත පැවැත්ම දකින භික්ෂුව මේ සියලු දේ ඉදිරියේම ඉවසීමෙන් උපේක්ෂා සහගතවයි වාසය කරන්නෙ.

- තමන්ට නින්දාවක් අපහාසයක් දුකක් එනවිට කලබල වෙන්න හොඳ නෑ. ඊට අදාල හේතු තියෙනකම් විතරමයි ඒවා පවතින්නේ. ඒ හේතු නැති වීමෙන් ඒ සියල්ලම නැති වෙනවා. මේ ස්වභාවය තේරුම් ගත් කෙනෙක් කුමකට නම් කලබල වන්නද ? උපේක්ෂාවෙන් යුතුව තමන්ම ඉවසීම පුරුදු කරමින් නොසැලී සිටින්න ඕනි.

- ලාභසත්කාර කීර්ති ප්‍රශංසා එන විට උදම් විය යුතු නැහැ. ඊට අදාල හේතු නිසාමයි ඒවත් පවතින්නේ. ඒ හේතු නැති වුනාම ඒවා නැති වෙනවා. කුමක් පිණිස නම් සතුටු වන්නද? ඒවට උමතු නොවී උපේක්ෂාවෙන් යුතුව කටයුතු කරන්න ඕනි.

- යමෙකුට මේ නින්දා අපහාස දුකත් ලාභසත්කාර කීර්ති ප්‍රශංසා සැපත් එකම විදියට දැකීමේ හැකියාව තියෙනවා නම් මේ ලෝකෙට ඔහු ඇලෙන්නෙත් නෑ, ගැටෙන්නෙත් නෑ. ඒක නිවන් මඟ පුරුදු කරන භික්ෂුවට හරි පහසුවක්.

- මේ බාහිර රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අරමුණු ලෝකයේ තිබෙන චිත්‍ර විතරයි. ඇස, කණ, නාසය, දිව, කය, මනසට ගෝචර වුනාම හටගන්නා පංච උපාදානස්කන්ධයටයි "මම" කියල මේ ලෝකයා බැඳිලා යන්නෙ.

- ඒ හටගන්නා පංච උපාදානස්කන්ධයන් ඒ හේතු නැති වීමෙන් නැතිවෙලා යනවා. නමුත් මේ හටගැනීමත් නැති වීමත් දකින්නේ නැති කෙනා බාහිර චිත්‍ර වන රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අරමුණු වලට සජීවී ස්වභාවයක් දෙනවා. ඒ දේවල් භව්‍ය වශයෙන් අරගන්නවා.

- ඊට පස්සේ තමන්ම සජීවී ස්වභාවයක් දුන්න රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අරමුණු කෙරෙහි ඇලීමෙන් ගැටීමෙන් යුතුව වාසය කරනවා. රාග ද්වේශ මෝහ මුල්කරගෙන කර්ම කරමින් සසරේ ගමන් කරනවා.

- ඇත්තෙන්ම මේ යථාර්තය දකින කෙනෙකුට මේ බොරු පැවැත්ම තුල ජීවත් වෙන්න නම් කැමැත්තක්

හටගන්නෙ නැහැ. නිදහස් වීමටමයි උත්සාහ කරන්නෙ.

❖ තථාගතයන් වහන්සේ පෙන්වා වදාළ විදියට මේ හටගන්නා පංච උපාදානස්කන්ධ වල ඇත්ත හොයන කෙනෙකුට පැවැත්මට ඇති අකමැත්ත මිස එය පවත්වන්නට කැමැත්තක් නම් හටගන්නේ නැහැ.

❖ රූප උපාදානස්කන්ධ පෙණ පිඬකට උපමා කොට වදාළේ එහි ඇති නිස්සාරත්වය නිසාමයි. පෙණ පිඬ කියා දෙයක් නැත. හේතු නිසාම පවතින හේතු නැතිවීමෙන් නැතිවන දෙයක් පමණි පවතින්නේ. නමුත් මෝඩ කෙනා පෙණ පිඬ පවතිනවා වගේමයි දකින්නෙ.

❖ ඒ ඒ මොහොතේ ඒ ඒ හේතු නිසා හටගන්නා අයුරු ප්‍රඥාවෙන් නොදකින නිසායි අඥාණයා ඒ විදියට දකින්නේ. ඒ ඒ මොහොතේ ඒ ඒ හේතු නිසා හටගන්නා ආකාරය නොදකින නිසා ඒ අඥාණයාට රූපයක් ලෝකයේ පවතිනවා කියලමයි දකින්නෙ. ඒ

හේතු නැතිවීමෙන් නැතිවන ආකාරය නොදකින නිසා, අඥාණයාට පේන්නේ තිබුණ රූපය නැතිවුණා කියලයි. ඒ නිසාමයි මේ සත්වයන් සංසාරෙ ගමන් කරන්නේ. ගොම පිඬ තරම්වත් හරයක් මේ රූප උපාදානස්කන්ධයේ නැති බව තථාගතයන් වහන්සේ වදාළේ, හේතු නිසාම පවතින උපාදාන වීමෙන් නිර්මාණය වන පිළිබිඹුවක් නිසාය. ඒ ආකාරයට මෝඩ කෙනා නොදකින නිසාම ඔහු පිළිබිඹුවීමට සජීවී බවක් ආරෝපණය කරගන්නවා. ඒ නිසාම දුක පවතිනවා.

- මේ දහම තේරුම් ගැනීම එතරම්ම අපහසුයි. ඒ නිසාමයි අන්ධයන් වගේ දුක කරාම ගමන් කරන්නේ.

- තථාගතයන් වහන්සේ වේදනා උපාදානස්කන්ධයේ නිස්සාරත්වය පෙන්වා වදාළේ දිය බුබුලකට උපමා කරමින්. දිය බුබුලක් කෙනෙකුට පෙනෙන්නෙ පවතිනවා කියලමයි. නමුත් එයත් පවතින්නේම හේතු නිසා විතරමයි. හේතු නැතිවීමෙන් නැතිවෙනවා. මේ හේතු ඵල දහම නොදකින පුහුදුන් කෙනාට මේ

වේදනාවක් පවතිනවා කියලමයි හිතෙන්නෙ. ඒ වේදනා විඳින්නෙ මම කියලයි හිතෙන්නෙ. ඒ වේදනාවත් මම කරගත් නිසාමයි ඒ තුල තමන් ජීවත් වන්නේ. එතකොට ඒ අශ්‍රැතවත්ට වේදනාවත් මමත් අතර වෙනසක් නෑ. සක්කායදිට්ඨිය තුලටම බැසගන්නවා. ඒ වේදනාව මම කියල හිතනවා. නැතිනම් වේදනාවෙන් මම හැදුන බව සිතනවා. වේදනාව තුල තමා ඉන්නවා කියල හිතනවා. තමා තුල වේදනාව තියෙනවා කියලා හිතෙනවා. මේ හැඟීම් සිත අභ්‍යන්තරයේම පවතින දේවල්.

❖ නමුත් ඒ හටගත් වේදනාව හේතු ඵල දහමට යටත් වූවක්. ඒ හේතු නැතිවීමෙන් නැතිවෙනවා. නමුත් මමත්වය නම් නැතිවන්නේ නැහැ. ඊළඟ එකට ආයේ මමත්වය හටගන්නවා. මේ දහම නොදකින තුරාවට අශ්‍රැතවත් කෙනාට මේ දුකින් නම් නිදහස් වීමක් නැහැ.

❖ මේ ලෝක සත්වයා විපරීත වූ සංඥාවකින් ජීවත්වන ආකාරය පෙන්වා දීම උදෙසා මිරිඟුවකට සංඥා උපාදානස්කන්ධය උපමා කලේ. මිරිඟුව හරියට

වටහා ගත් නුවණැත්තෙකු ලෝකයට කෙසේ නම් ආශා කරන්නද?

- වතුර නැති තැන වතුර තිබෙන බවම පේන එකට මිරිඟුව කියනවා. වතුර ඇතැයි නොවෙයි, වතුර වගේම දෙයක් හේතු නිසා නිර්මාණය වුනා. හැබැයි ඒ හේතු නැති වුනාම නැතිවෙනවා. එතන වතුර නෑ. ඒ වගේම මේ සංඥා උපාදානස්කන්ධත් දකින්න ඕනි.

- හේතු නිසා උපාදානයෙන් පිළිබිඹු වන රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම සංඥාවන් නොදකින නිසාම රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අරමුණු තිබෙන බවමයි හිතෙන්නේ. හරියට මිරිඟුව වගේමයි. මිරිඟුව හේතු නිසා හටගත් මිරිඟුවක්ම බව නුවණින් දැක්කා නම් වතුර බවට රැවටෙන්නෙ නැහැ. ඒ වගේම හේතු නිසා හටගත් සංඥා උපාදානස්කන්ධය නුවණින් දැක්කා නම් රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අරමුණු වල නිත්‍ය ස්වභාවයක් දකින්නේ නැහැ. ඒවා තිබෙන බව හෝ හරයක් ඇති බව හිතන්නේ නැහැ. උපාදානයෙන් නිර්මාණය වුන පිළිබිඹුවක් විතරමයි කියා වටහා ගන්නවා.

- දේදුන්නක් නිර්මාණය වන්නේද හේතු සමූහයක ක්‍රියාකාරිත්වය නිසාය. එනමුත් දේදුන්නක් අහසෙහි තිබෙන බවට පුංචි ළමයෙකුට පේනවා. නමුත් එය තිබෙන තැනක් තිබේද? නැත. හේතු නිසා හටගැනීමක් පමණි ඇත්තේ. හේතු නැති විට නැතිවෙනවා. සංඥා උපාදානස්කන්ධයත් ඒ වගේමයි.

- මේ විදියට මනා ප්‍රඥාවෙන් යමෙක් මේ සංඥා උපාදානස්කන්ධය දකී නම් ලෝකයට කුමක් පිණිස ආශා කරන්නද?

- කෙසෙල් ගසක් තුලින් අරටුවක් හොයන්න ගන්නා මහන්සිය කොපමණ අඥාණ කමක්ද? ඒ අඥාණ කමට උපමා කරලයි සංස්කාර උපාදානස්කන්ධය තථාගතයන් වහන්සේ වදාළේ.

- හේතු නිසා ගොඩනැගුණු ලෝකය හේතු නැතිවීමෙන් නැතිවෙනවා. හේතු නිසා හටගන්නා දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත ලෝකයට මුල වීම නිසා දකින්න, අසන්න,

දැනෙන්න, දැනගන්න යමක් තිබෙනවා කියල අරගන්නවා. ඒලෙස අරගෙන ඒ කෙරෙහි චේතනා පවත්වනවා. නමුත් ඒ සියලුම චේතනා හේතු නැතිවීමෙන් නැතිවෙනවා.

❖ ඒ පවත්වපු චේතනා තුලින් කිසිම භව්‍ය දෙයක් ලැබුනේ නැහැ. ලැබෙන්නෙත් නැහැ. හේතු නැතිවීමෙන් නැතිවෙනවා.

❖ හේතු නිසා හටගත් ලෝකයට උපාදාන වී නිර්මාණය වුන පිළිබිඹුවට සජීවී බවක් ආරෝපණය කරමින් මෙතන පැවැත්වීමේ හරය කිම? හරියට අභිරූපණ රංගනයක් වගේ.

❖ පුටුවක ඉඳගෙන, මේසයක තියාගෙන, පොතක, පෑනකින් ලිපියක් ලියන බව අභිරූපණය කරනවා. ඒ සිදුවන සියල්ලම හිස් දෙයක්. පුටුවක්, මේසයක්, පොතක්, පෑනක් ඇතැයි කියල මවාගෙනයි ඒ අභිරූපණය කරන්නෙ. ඒවගේමයි මෙයට මුලාවන සත්වයා ඇස, කන, නාසය, දිව, කය, මනස ඔස්සේ

චේතනා පවත්වමින් දිගින් දිගටම සසරේ සැරිසරාගෙන දුක උරුම කරගනිමින් සිටින්නේ.

- සතර පැත්තකින්ම හොඳට නිරීක්ෂණය කල හැකි වුවත් සිව්මංසලක විජ්ජාකාරයෙක් විජ්ජාවක් පෙන්වන විට කරන මැජික් එක බොරුවක් කියල දකින කෙනෙකුට කිව හැකිද? බොරුවක් වුවත් මායාවක් වුවත් බොරුවත් මායාවත් නොපෙන්වන විදියට සත්‍යයක් ලෙසටම එය පෙන්වීමේ හැකියාව මැජික් කාරයාට තියෙනවා. ඒ වගේමයි මේ විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය.

- ඇසින් රූපයක් දකින විට ඊට අදාල හේතු නිසා ඇස තුල විඤ්ඤාණය හටගන්නවා. කනට ශබ්දයක් ඇසෙන විට ඊට අදාල හේතු නිසා කන තුල විඤ්ඤාණය හටගන්නවා. නාසයට ගන්ධයක් දැනෙන විට ඊට අදාල හේතු නිසා නාසය තුල විඤ්ඤාණය හටගන්නවා. දිවට රසයක් දැනෙන විට ඊට අදාල හේතු නිසා දිව තුල විඤ්ඤාණය හටගන්නවා. කයට පහසක් දැනෙන විට ඊට අදාල

හේතු නිසා කය තුල විඤ්ඤාණය හටගන්නවා. මනසට අරමුණක් දැනෙන විට ඊට අදාල හේතු නිසා මනස තුල විඤ්ඤාණය හටගන්නවා. මොනවද ඒ අදාල හේතු?

- ඇස, කන, නාසය, දිව, කය, මනස කෙරෙහි යොමු වූ අවධානය ඕනි (මනසිකාරය). ඒ තුලින්ම පැන නැගුන ස්පර්ශය ඕනි. ඒ තුලින්ම පැන නැගුන වේදනා, සංඥා, චේතනා ඕනි. ඒ තුලින්ම උපාදානීය වූ සතර මහා ධාතූන්ගේ ක්‍රියාකාරීත්වය ඕනි.

- මේ මොනවාද? රූප, වේදනා, සංඥා, සංඛාර කියන උපාදානස්කන්ධ හතර තමන්ගේ ජීවිතයට ගෝචර වන්නේ විඤ්ඤාණ උපාදානස්කන්ධය තුලින් කියන එක නේද?

- ආයතන හය ඔස්සේ ඒ විඤ්ඤාණය හට ගන්නේම ඊට අදාල නාමරූපවල ක්‍රියාකාරීත්වය නිසාමයි. රූපයෙහි, වේදනාවෙහි, සංඥාවෙහි, සංඛාරයෙහි

සත්‍යය ස්වභාවය පෙන්වන්නෙ නැත්තේ විඤ්ඤාණයේ මායාවෙනි.

- රූපය පෙණගුලියක් බවද, වේදනාව දිය බුබුලක් බවද, සංඥාව මිරිඟුවක් බවද, සංඛාරය කෙසෙල් අරටුවක් බවද පේන්නෙ නැත්තේ විඤ්ඤාණයේ මැජික් එක නිසාය.

- හටගත්ත දිට්ඨ සුත මුත විඤ්ඤාත ලෝකය තිබෙන බව සජීවී බව මැජික් කාරයා විසින් පෙන්වනවා. බොරුවක් කියන්න බැරි තරමට තියන බව සජීවී බව මේ මැජික් කාරයාගේ මායාවෙන් පෙන්වනවා.

- විඤ්ඤාණය කියන්නේම රූප, වේදනා, සංඥා, සංඛාර වල ක්‍රියාකාරිත්වයෙන්ම හටගත් එකක්. ඒ හටගත් විඤ්ඤාණයෙන් රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අරමුණු වලට සජීවී බවක් දීලා ඒවා තියෙන බව පෙන්වනවා. මේ සක්කායදිට්ඨිය එතරම්ම ප්‍රබලයි.

❖ මනසින් ගොඩනගාගෙන ඒ දේවල් නැහැ කියල සිතුවත් වැඩක් නැහැ. මනසට අරමුණක් තිබ්ලයි ඒ විදියට සිතන්නේ. ඒ තරම්ම විඤ්ඤාණයේ මැජික් එක මායාකාරියි. මේකෙන් නිදහස් වන එක කෙතරම්ම අසීරුද?

❖ මේ උපාදානස්කන්ධ පහ වෙන වෙනම කථා කලාට එකට හටගන්නා ඒවා. ඒක තේරුම් ගැනීමට ප්‍රඥාව ඇතිකරගැනීමටයි හේතුඵල නුවණ ඇතිකරගැනීමටයි බෙද බෙදා තථාගතයන් වහන්සේ පෙන්වා වදාළේ.

❖ දිට්ඨ සුත මුත විඤ්ඤාත හට ගන්නා විට ඔය පහම හටගන්නවා. බෙද බෙදා හේතුඵල වශයෙන් තේරුම් ගන්නා විටයි ඒ බොරු පැවැත්මට කලකිරීම ඇතිවන්නේ.

❖ ඇත්තෙන්ම මේ බොරු පැවැත්මෙන් නිදහස් වන්නේ කවදාද? මේ සියලු සම්බන්ධ වල නිස්සාරත්වය දකින්නේ කවදාද? සතිය, වීරිය, ප්‍රඥාව තුලින්

වික්ෂිප්තභාවයේ මැජික් එක දකින්නේ කවදාද ? ඒ මැජික් එක බොරුවක් හිස් දෙයක් බව දකිමින් උපේක්ෂාවෙන් ජීවත් වන්නේ කවදාද?

❖ ජීවිතයේ යථාර්තය වටහා නොගත් අඥාණ කෙනා තමන්ම ලෝකය ගොඩනගාගෙන, ඒ ගොඩනගාගත් ලෝකය තුල ජීවත් වීමට උත්සාහ කරනවා. ඒ ගොඩනගාගත් ලෝකය තුල තිබෙන්නේ මානසික පුහු ආශ්වාදයක් පමණි. කුෂ්ඨ රෝගියා කුෂ්ඨය කසමින් ලබන්නා වූ සැපය මෙනි.

❖ මේ ආශ්වාදය තුල ජීවත් වීමට කොපමණ වෙහෙසක් අඥාණයා දරනවාද? ඔහුගේ සියලු දේ තුලින් සසර පැවැත්මක්මයි සකස් වන්නේ.

❖ මේ ආදීනවය තේරුම් ගත් තවත් බොහෝ අය මේ ගොඩනගාගත් ලෝකය එපා කියල ඉක්මවා දුවන්න හදනවා. නමුත් කවදාවත් නිදහස් වන්න බැහැ.

❖ තමන්ම ලෝකය ගොඩනගාගෙන ඒක එපා කියල මොන දේ කලත් කෙසේ නම් නිදහස් වන්නද?

❖ මේ ලෝකයා දුකින් නිදහස් වන්න සොයන්නේම ගොඩනගාගත් ලෝකය ඉක්මවා දිවීමෙනි.

❖ මේ ලෝකයට අසහාය ප්‍රඥාවක් ඇති උතුම් මිනිසෙකු පහල වන තුරාවටම, සසර කෙරෙහි කලකිරුන අය එයින් නිදහස් වීම සොයන්නේම ඉක්මවා දිවීමෙනි.

❖ ජරා මරණ වලින් පීඩිත මේ සසරින් නිදහස් වීමක් සොයන්න ගිහිගෙයින් නික්මුනු, සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ, එකල දුකින් නිදහස් වීම පිණිස පැවති සියලු මාර්ග වල පරතෙරටම පුරුදු කලේය. එනමුදු ඒ කිසිම මාර්ගයකින් දුකෙන් එතර විය නොහැකි බව වටහා ගැනීමට තරම් අසහාය ප්‍රඥාවක් සිද්ධාර්ථ ගෞතමයන්ට පැවතිනි.

❖ සකස් වුන ලෝකයෙන් නිදහස් වීමක් නොවන බව වටහා ගත් සිද්ධාර්ථ ගෞතම බෝසතාණන් වහන්සේ

තමා තුල නිර්මාණය වන ලෝකය හැදෙන ආකාරය හේතු ඵල වශයෙන් විමසීමට පටන් ගත්තේය. ඒ තුලින් ගොඩනැගුනු ප්‍රඥාව තුලින් මේ ඉදප්පච්චයතාව නම් වූ දහම් න්‍යාය අවබෝධකරගෙන ඒ සියල්ලම ඉක්මවා නිවීම සාක්ෂාත් කළ සේක.

❖ ඉදප්පච්චයතාවය නම් වූ ආර්ය න්‍යාය නොදන්නා කම නම් වූ අවිද්‍යා පදනම නිසාම මේ ලෝක සත්වයන් තම තමන්ගේ ලෝකයන් ගොඩ නගාගෙන ස්වකීය රාමුව තුලට කොටු වී එයින් පලායාමක් හොයන ආකාරයද වටහාගත් සේක.

❖ අසහාය ප්‍රඥාවකින් හෙබි ගෞතම බුදුරජාණන් වහන්සේ නුවණැති දෙවි මිනිසුන් උදෙසා මේ ඉදප්පච්චයතාව නම් වූ හේතු ඵල දහම ලෝකයට විවර කල සේක. පෙන්වූ සේක. පනවා වදාළ සේක. ඒ මඟ ඵලෙස පුරුදු කල නැණවතුන්ද නිවීම පසක් කල සේක.

- ඉදප්පච්චයතාව නම් වූ හේතු ඵල දහම නොදන්නාකම නම් අවිද්‍යාව නිසා ලෝකයක් තිබෙනවා, තිබෙන ලෝකයේ ජීවත්වන මම සිටිනවා කියන අදහස සියලුම සතුන්ට ඇති වෙනවා. ඒ හැඟීම නිසා තිබෙන ලෝකය තමන්ට තේරුම් ගැනීම පිණිස නාමරූප විඤ්ඤාණ ක්‍රියාකාරීත්වයක් ආයතන ඔස්සේ සිදුවෙනවා. ඒ තුලින් තණ්හා උපාදාන සමඟ පුද්ගලයාගේ පැවැත්ම පිණිස නිර්මාණය වන ලෝකය තුල ජීවත් වීමට උපාදානස්කන්ධයන් තුලට යොමු වී එයටම බැසගෙන ජරා මරණ ශෝක පරිදේව නම් වූ අනේක දුක් තුලටම කොටු වී සසර තුල පැවතෙමින් ජීවත් වෙනවා.

- මෙලෙස ස්වකීය රාමුව තුලම සතුටු වෙමින්ද ස්වකීය රාමුව තුලම ගැටීමෙන්ද යුතුව ලෝකයා සසර තුල ජීවත් වෙනවා.

- මේ ජරා මරණ දුක එපා වුන ඇතමුන් තමන් නිර්මාණය කරගත් ස්වකීය රාමුවම ඉක්මවා යන්නටද

උත්සාහ කරති. එනමුදු කා හට නම් එයින් නිදහස් විය හැකිද?

- තමන් ගොඩනගා ගන්නා ස්වකීය රාමුව ඉදප්පච්චයතාව නම් වූ හේතු ඵල න්‍යාය තුලින් දකින තුරාවට අවිද්‍යා අන්ධකාරය නම් සිඳලිය නොහැක්කේමය.

- ඇත්තෙන්ම මේ අවිද්‍යා අන්ධකාරය සිඳලූ ඒ රහත් මුනිවරු ස්වකීය රාමුව තුලට කොටු නොවී නිදහසේ සන්සුන් මනසින් යුතුව ජීවත් වන්නේය.

- ඒ සන්සුන් මනසින් යුතුව ජීවිත ගත කිරීම පිණිස කවදා නම් අවිද්‍යා අඳුර සිඳලන්නේද? මේ ඉදප්පච්චයතා න්‍යාය ඉක්මවා කවදා නම් උපේක්ෂා සහගත ජීවිතයක් ගතකරන්නද?

- වර්තමානය තුල මේ ඉදප්පච්චයතාව තේරුම් නොගන්නා නිසාම අතීතයේ හිටිය කියල මානසිකව සිතාගෙන, අතීතයේ කරපු කියපුව ගැන සිත සිතා

මානසිකව ඒ ලෝකය තුල ජීවත් වෙනවා. අනාගතයේ කරන්න තියන දේවල් ගැන සිතමින් මානසිකව ජීවත් වෙනවා. මෙලෙස හිතලුවෙක් නොවී යථාර්තය දකින ප්‍රඥාවෙන් වර්තමානයේ ජීවත් වන්නේ කවදාද?

❖ මෝහ අන්ධකාරයෙන් යුතු ලෝකයාට මේ ලෝකය තිබෙනවාය කියා සිතමින් ඒ තුල ජීවත් වෙමින් උදම් අනන්නේ වැලිකතරේ මිරිඟුව දකිමින් වතුර සොයා හති දමමින් ඒ පසු පස ලුහු බඳින්නා මෙනි.

❖ අවිද්‍යාව නිසා තමන් සකස්කරගත් ලෝකය දුකක්, කරදරයක් යැයි වටහාගත් මේ ලෝකයා එයින් නිදහස් වීම පිණිස එය ඉක්මවා දුවන්නේ තමා පිටුපසින් එන සෙවණැල්ල එපා කියමින් දුවන්නාක් මෙනි.

❖ මේ අභිංසක වෑයම තුලින් සොයන්නේම සාස්වතයෙන් පලායන්නට, උච්ඡේදයක් කරා ළඟා වීම සඳහාය.

- ඒ අහිංසක වෑයම තුලිනුත් කිසිම දිනක නිදහස් වීමක් නම් ළඟාකරගත නොහැක්කේමය.

- මේ ලෝක සත්වයා සොයන්නේම දුකින් පලායන්නමයි. දුකින් පලාගොස් සතුටින් සිටීමටයි කැමති. නමුත් ඒ සනාතන සතුට ඒ විදියට ලබන්න බෑ.

- ජීවිතයේ යථාර්තය නොදකින නිසා නොසන්සිඳුන ආශාවකින් යුතුව කිසිදා ළඟා නොවන සැපයක් ඔස්සේම ගමන් කරනවා.

- ආත්මීය වැඩපිළිවෙලකින් තොර හේතුඵල පැවැත්මක් පවතින බව නොදකින නිසාම මේ පුහුදුන් ලෝකයා තමන් කැමති විදියට ජීවිතේ පවත්වන්න උත්සාහ කරනවා. නමුත් කවරදාකවත් ඒ විදියට පැවැත්විය නොහැක. හේතුඵල දහමක පැවැත්මක් මිස ආත්මීය වැඩපිළිවෙලක් ඒ තුල නැති නිසාය.

- ඒ විදියට කටයුතු කිරීම තුලින් නිවන් මගත් අවහිර වෙනවා. තමන් හොයන නිවන කවරදාකවත් ලැබෙන්නේ නැහැ.

- සද්ධර්මයට ගරු කරන, සද්ධර්මය කථාකරන ශ්‍රේෂ්ඨ උතුමන්වයි ඇසුරු කරන්න ඕනි. ඒ උතුමන් ඇසුරු කරන විට පිරිහීමක් නම් ඇතිවන්නේ නැහැ.

- ඒ විදියට කල්‍යාණ මිතුරන් ඇසුරු කරන විට ඒ ධර්මය තමන්ටත් ගලපා ගන්න පුළුවනි. ඒ ධර්මය තමන්ටත් අත්දකින්න පුළුවනි.

- ඒ කල්‍යාණ මිතුරන් ඇසුරු කරන්න ඕනි. ඒ උතුමන්ගේ වචනයට අවනත වෙන්න ඕනි. ඒ උතුමන්ට යොමු වූ සිතක් තියෙන්න ඕනි. එවිටයි තමන්ට ඒ ධර්මය තේරුම් ගත හැකි වන්නේ.

- මේ මුළු නිවන් මඟම තිබෙන්නේ කල්‍යාණ මිතුරන් නිසාම බව තථාගතයන් වහන්සේ වදාළා. ඒ උතුම් ලාභය මඟහරවා ගන්න හොඳ නෑ.

❖ තමන්ගේ හිතට සිතුවිලි එන්නේම අවිද්‍යා පදනම නිසයි. ඒවා ක්‍රියාත්මක කලොත් දහම් මඟ මගහැර යාවි.

❖ පින නිසාම මිනිසත් බව ලැබුනා. පින නිසාම කල්‍යාණ මිතුරන් ලැබුනා. පින නිසාම පැවිදි වුනා. නමුත් යථාර්තය දකින්න පින නිසාම බැහැ.

❖ යථාර්තය දකින්නට නම් තමා තුල ඇතිවුන ප්‍රඥාව ඕනි. ඒක ඇතිකරගන්න ශුන්‍යතා ප්‍රතිබද්ධ තථාගත ධර්මය අසන්න ඕනි. ඒ ධර්මය කියන උතුමන් ඇසුරු කරන්න ඕනි. ඒ ධර්මය නුවණින් විමසන්න ඕන.

❖ ඉතාම කලාතුරකින් ලැබෙන, මහා පිනකින් ලැබෙන මේ ක්ෂණ සම්පත්තිය අහිමි වෙන්න දෙන්න හොඳ නෑ. ඒක අහිමි වුනොත් ආයේ කවදා නම් ඒ අවස්ථාවක් ලබන්නද?

❖ තමන්ගේ හිතට වහල් වී, හිතලුවෙක් වගේ කටයුතු කලොත් මේ අවස්ථාව මගහැරේවි. ඒ නිසා ධර්මය

කියන, ධර්මයේ හැසිරෙන ඒ කල්‍යාණ මිතුරන් අභිමි වන්නට පෙර මාර්ගය පුරුදු කරන්න.

❖ එවිට මේ අවිද්‍යා අන්ධකාරය නැතිකර දමන්නට හැකිවේවි. අටලෝ දහම එනවිට ඒවාට සැලෙන්න හොඳ නෑ. ඒවාට අනුව කටයුතු කරන්න හොඳ නෑ. නුවණ තියෙන කෙනා ඒවා ඒ විදියටම තියෙද්දී නුවණින් යුතුව ඉවසීමෙන් උපේක්ෂාවෙන් කටයුතු කරනවා.

❖ ඒ කෙනාටයි මේ මාර්ගය විවෘත වන්නේ. අලාභ, නින්දා, අපකීර්තිය, දුක එන විට කලබල වෙන කෙනා ලාභ, කීර්ති, සැප එන විට ඒවාට යට වෙනවා. මොකද පුහුදුන් සියලු දෙනාම කැමති සතුටින් ඉන්නයි.

❖ ධර්මය ටිකක් දැනගත්ත පමණින් මේ ධර්ම මාර්ගය පුරුදු කරනවා කියන එක අමාරුයි. හුදකලා වුනා කියල ජීවිතේ සත්‍යය අත් දකින්න අමාරුයි. වනාන්තරයකට ගියා කියල කෙලෙස් දුරු වෙන්නේ නැහැ.

- වනාන්තරයේ හුදෙකලා වුන සමහර භික්ෂූන් ඒ හුදෙකලාව නිසාම බය භීතිය ඇතිවෙලා මේ ධර්ම මාර්ගය අතහැරල පිරිහිලා යනවා. තවත් සමහර අය වනාන්තරයේ තියෙන විවේකයට ඇලිලා ඒ තුල සතුටු වෙමින් තමන්ට කෙලෙස් එන්නේ නැති නිසා සතුටු වෙනවා. එතකොට සමහරු ධර්මය අවබෝධ වුනා කියල හිතනවා. තවත් සමහරුන්ට පිරිස ඇසුරු කරන්නට අමාරු වෙනවා. ඒ අයත් එක්ක ගැටෙනවා. එතකොට කල්‍යාණ මිතුරන්ද අහිමි වෙලා යනවා.

- නමුත් හොඳට ධර්මය දන්න, ධර්මය වටහා ගත්ත, ජීවිතය තුලින් ධර්මය අත්දකින සැබෑම ශ්‍රද්ධාවන්තයෙකුට නම් හුදකලාවේ වනාන්තරය තුල වාසය කිරීමම සැපයක්. ඒ භික්ෂුවට පුරුදු කිරීම පිණිස සියල්ලම ලැබිලයි තියෙන්නෙ. නමුත් ඒ භික්ෂුව පවා සියලු කෙලෙස් නසා දමන තුරාවට කලින් කල කල්‍යාණ මිතුරන් ඇසුරු කරන්නට යන්න ඕනි. ඒ උතුමන්ට ගරු බුහුමන් දක්වන්න ඕනි. එයාට තමයි මේ ශාසනය තුල සතුටින් මාර්ගය පුරුදු කරමින් නොඇලී වාසය කරන්න පුලුවන්.

- එවැනි භික්ෂුවක් පිරිස අතරට ගියා කියල ගැටෙන්නේ නැහැ. ඒ සියලු දේවල් විදර්ශනා නුවණට හසුකරගන්න ඔහු දක්ෂයි.

- මේක ශාසනය පිරිහීගෙන යන කාලයක්. අවසාන අවස්ථාව තුලයි ක්ෂණ සම්පත්තිය ලැබුනේ. මේ අවස්ථාවෙන් තමන්ගේ හිතට වහල් වෙලා මේ උතුම් අවස්ථාව අහිමිකරගන්න හොඳ නෑ.

- මේ යුගයේ සිටින්නෙ ප්‍රඥාව මඳ අය. ඒ නිසා හොඳට ධර්මය හදාරන්න ඕනි. කළ්‍යාණ මිතුරන්ගෙන් නොතේරෙන කරුණු අසා දැනගන්න ඕනි. නිවැරදිව ධර්මය තේරුම් ගන්නේ නැතිව පුරුදු කරන්න ගියාට වැඩක් නැහැ. එළදෙනගෙ අන්දෙකෙන් කොච්චර මහන්සි වෙලා කිරි ඇද්දත් වැඩක් නැහැ. කවදාවත් කිරි නම් ලැබෙන්නෙ නැහැ. නමුත් තන බුරුල්ල තුලින් කිරි එන බව තේරුම්ගෙන ඉතාම සුළු උත්සාහයකින් වුවත් කිරි ලබාගන්න පුළුවනි.

❖ හොඳට ධර්මය හදාරපු, හොඳට ධර්මය වටහාගත්, කල්‍යාණ මිතුරන්ට යොමු වූ සිතින් ගෞරවයෙන් ඒ උතුමන් ඇසුරු කරල, ඒ උතුමන්ගේ වචනයට අවනත වෙලා ඒ ධර්මය තුල පිහිටි භික්ෂුවකට ඉතා සියුම් අරමුණු පමණක් නොව පීඩාකාරී අරමුණු තමන්ට ගෝචර වන විට පවා විදර්ශනා ප්‍රඥාව තුලින් පුරුදු කිරීමට පුළුවනි. පාරේ තිබෙන මකුළු දැල් හස්ථිරාජයෙක් කඩාගෙන යනවා වගේ ඒ භික්ෂුවට ඒ අරමුණු විදර්ශනා ප්‍රඥාවෙන් දැකලා ගලවලා දමන්න පුළුවනි.

❖ මේ සියලු දේවල් ධර්මයට බැසගත් කෙනෙකු තුල චිත්ත අභ්‍යන්තරය තුල සිදුවන ක්‍රියාවකි. ඒ කිසිදු දෙයක් තව කෙනෙකුට තේරුම් ගත නොහැක. බාහිරින් වනාන්තරය තුල වාසය කලත් ජීවිතයේ අභ්‍යන්තර ප්‍රශ්නය විසඳගන්න දන්නැතිනම් ඒකෙන් ඵලක් නැහැ. රාග ද්වේශ වලින් පීඩා දුරු කරලා සමාධියක් ලබාගෙන බ්‍රහ්ම ලෝක වලට යන්න පුළුවනි. හැබැයි මේ නිවන් මග අහිමි වෙනවා.

- සියලු කෙලෙස් නසා දමන තුරාම කල්‍යාණ මිතුරන්ගේ ඇසුර තුලින් සද්ධර්ම ශ්‍රවණය, ධර්ම සාකච්ඡාව ඕනි කියලයි බුදුරජාණන් වහන්සේ වදාළේ. ඒ තුලිනුයි මේ ධර්ම මාර්ගය තුල ඉන්න පුළුවන්. ඒ නිසා ඒ සම්පත අහිමි කරගන්න හොඳ නෑ. ඒ තුලින් උපරිම ප්‍රයෝජන ලබාගන්න ධර්ම මාර්ගයම පුරුදු කරන්න ඕනි.

- මේ සිතට එන සිතුවිලි තේරුම් ගෙන ඒවාට හසු නොවී ඉන්න, විදර්ශනා නුවණ නැති කෙනෙකුට හරිම අමාරුයි.

- සිතයි, සිතුවිලියි අතර සම්බන්ධය නොදන්නා කම නිසා සිතයි, සිතුවිලියි එකක් කියල අරගෙන ඒ සිතුවිලි ක්‍රියාත්මක කරනවා. ඒ තුල සක්කාය දිට්ඨියමයි පවතින්නේ.

- හේතුඵල වශයෙන් වටහාගත් ඒ තථාගත ධර්මය තමන්ගේ ජීවිතය තුලින් අත්දකින කෙනෙකුට සිතත්, සිතුවිලිත් අතර පැවැත්ම හේතු ඵල දහමින් තේරුම් ගන්න පුළුවනි. හේතුඵල වශයෙන් ඒ සිතුවිලි හැදෙන

හැටි දකින්න පුළුවනි. විදර්ශනා ප්‍රඥාවෙන් ඒ විදියට දකින කොට ඒ සිතුවිලි වලට දාසයෙක් වෙලා ඒවා ක්‍රියාත්මක කරන්නේ නැහැ.

❖ සිතෙහි, සිත අනුව බලන්න කියලයි චිත්තානුපස්සනාව තුල තථාගතයන් වහන්සේ පෙන්වා වදාළේ. මේ විදියට දකින්න නම් දහම තුලින් නිරවුල් වන හේතුඵල වශයෙන් බලන්න පුළුවන් නුවණක් තියෙන්න ඕනි. එවිටයි ඒ සිතුවිලි හරයක් නැති දෙයක් බවට පත්වෙලා සකස් නොවන්නෙ.

❖ ඒ විදියට නොදකින කෙනා ඒ සිතුවිලි සත්‍යයි කියල හිතලා ඊට අනුව කටයුතු කරනවා. හස්ථියෙක් මකුළු දැල් කඩාගෙන යනවා වගේ ඒ සිතුවිලි වල හිස් බව දැකල නුවණින් යුක්තව කටයුතු කරන භික්ෂුව සිතුවිලි වලට යට වන්නේ නැහැ. කෙසෙල් ගසෙහි අරටුවක් නැති බව හොඳට දකින්න පුළුවන් විදර්ශනා ප්‍රඥාවක් එයාට තියෙනවා.

❖ ඇත්තෙන්ම මේ තථාගත ධර්මය ආශ්චර්යයි. ජීවිතයේ සත්‍යය පෙන්වා දෙන සනාථන රැකවරණය ලබා දෙන මේ ධර්මයට ඇලුන ජීවිතයක් ගත කරන්න ඕනි. ඒ භික්ෂුවට සතුටින් වාසය කරන්න පුළුවනි.

❖ අතීතය අනාගතය ගැන සිතමින් සිතුවිලි ඔස්සේ මානසිකව තෘප්තියත් පීඩාවත් තුල මේ සත්වයා ජීවත් වන්නේ වමාර වමාර තලු මරමින් තණ කොල කන හරක් වගෙයි. වර්තමානය තුල ජීවත් වන්න උත්සාහ කරන භික්ෂුවකට ඒ විදියට ජීවත් වීම හරිම පීඩාකාරියි.

❖ වර්තමානය තුල හේතුඵල දහම දකිමින් ජීවත් වන විට හේතු නැති කිරීමෙන් නිවීම සාක්ෂාත් කළහැකි බව දකින විට අනාගතය තුල ගොඩනගාගත් නිවනක් හොයන අදහස නැතිවෙලා යනවා.

❖ මේ ලෝක සත්වයා නිතරම හොයන්නේ සතුටින් ඉන්න ජීවිතයක්. ඒ සඳහා අනාගතය තුල සිහින මවමින් ජීවත් වෙනවා. නමුත් කවදාවත් ඒ සනාථන සතුට නම්

ඇතිකරගන්න බැහැ. වර්තමානය තුලම හේතුඵල දහමම ප්‍රඥාවෙන් දකිනවා නම් ඒ භික්ෂුවට ඒ සනාථන සතුට අත්විඳින්න පුළුවනි.

- ඒ විදියට විදර්ශනා නුවණක් තියෙන භික්ෂුවකට ඉතා සියුම් දෘෂ්ටි පවා තේරුම් ගන්න පුළුවනි. ඒ සියල්ලම හේතුඵල වශයෙන් දැකල අත්හරින්න පුළුවනි.

- කාමයන් හොයන්නැති, කාමයෙන් සතුටු නොවන විදර්ශනා නුවණ තියෙන භික්ෂුවට මේ කාමයන් සමඟ ජීවත් වීමට කැමැත්තක් හටගන්නේ නැහැ. සියලු ලෝකයන් කෙරෙහි ඇති පැවැත්ම දුරු කිරීමටමයි කැමති වන්නේ.

- මේ කෙලෙස් සහිත ජීවිතයට නින්දා වේවා. කෙලෙස් නසාලූ උත්තමයන් ලබන සනාථන සැපය කවදානම් අත්විඳින්නද? කෙලෙස් සහිතව ජීවත් වෙනවාට වඩා මරණය උතුම්. විදර්ශනා ප්‍රඥාව තුල පිහිටලා ජීවිතය කෙලවර කරන්න තියෙනවා නම් මරණයත්, නිවීමත් දෙකම එක මොහොතේ ලබන්න පුළුවනි.

❖ ඇස, කන, නාසය, දිව, කය, මනස ඔස්සේ ලෝකය හා සම්බන්ධ වන විට නාමරූප විශේෂඥාණ ක්‍රියාකාරීත්වය දකින කෙනෙකුට මේ ලෝකය තුල පවතින්නට නම් කැමැත්තක් හටගන්නේ නැහැ. ඒ බොරු පැවැත්මෙන් නිදහස් වීමටමයි කැමැත්ත හටගන්නෙ.

❖ අප්‍රමාණ රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අරමුණු එනකොට ඒවා සකස් වෙන හැටි දකින්නේ නැති නිසා ඒ දේවල් ප්‍රිය අප්‍රිය වශයෙන් බෙදාගෙන ප්‍රිය දේවල් නැතිවෙන විටත් අප්‍රිය දේවල් එකතු වන විටත් දුක හටගන්නවා. නමුත් හේතුඵල නුවණින් නාමරූප විශේෂඥාණ ක්‍රියාකාරීත්වය දකිනවානම් මේ ප්‍රිය අප්‍රිය දේවල් තමන්ම සකස්කරගන්න බව දකින්න පුළුවනි. එවිට ප්‍රිය දේවල් නැති වුනත්, අප්‍රිය දේවල් එකතු වුනත් දුකක් නම් හටගන්නේ නැහැ.

❖ සංසාරය තුල කර්ම රැස්කරගනිමින් අවිද්‍යාව නිසා සත්වයා ගමන් කරනවා. ඒ අවිද්‍යාව මත රැස්කරපු කර්ම විපාක විඳවමිනුයි ඒ ඒ ලෝක වල ජීවිතය ගත

කරන්නෙ. සැප දුක ප්‍රිය අප්‍රිය දේවල් නින්දා ගැරහිලි මේ සියලු දේවල් කර්ම විපාකයට යටත් වූ දේවල්. ඒ දේවල් ඔස්සේ කරපු කර්ම විඳවන විට පෘථග්ජන ජීවිතය කම්පා වෙනවා. ඒ තුලින් තව තවත් විඳවන්න කර්ම රැස්කරගන්නවා. නමුත් විදර්ශනා ප්‍රඥාවක් කෙනෙකුට තියෙනවා නම් තමන්ම කරපු කර්මයන් විඳවන්න ලැබෙන විට ඒ ආයුධයෙන් ඒවට පහර දෙමින් සනාථන සැපය තුලටම යොමු වෙනවා. ඒ විදිහට හේතුඵල වශයෙන් දකින විට කරපු කර්ම විඳවන්න පුද්ගලයෙක් සකස් වන්නෙ නැහැ. කායිකව ඒ පීඩා වින්දට මානසිකව විඳවන්නේ නැහැ. නාමරූප විඤ්ඤාණ ක්‍රියාකාරීත්වය දකින විට සැප දුක ප්‍රිය අප්‍රිය දේවල් තමන් විසින් සකස් කරගැනීම නැති වෙනවා. ඉතින් කොහොම නම් ඒ දේවල් නිසා පීඩා විඳින්නද?

❖ ඒ විදිහට ධර්ම මාර්ගය පුරුදු කරන භික්ෂුවක් නිතරම ඇසුරු කරමින් ගරු බුහුමන් දක්වමින් වාසය කරන්න තියෙනවා නම් ඒවැනි භික්ෂුව පිරිහෙන්නේ නැහැ. ඒ භික්ෂුවටත් ඒ විදියටම ජීවත් වන්න පුළුවන්

නුවණ ඇතිකරගන්න පුළුවනි. ප්‍රඥාවන්තයෙකුට විතරමයි ඒ විදියට ප්‍රඥාව තියෙන භික්ෂුවක් ප්‍රඥාව තුලින් ඇසුරු කරන්න පුළුවන්. ප්‍රඥාව නැති කෙනෙකු බාහිර දේවල් ඔස්සේම කල්පනා කරමින් හිත අපහදගන්නවා. ඒ ධර්මය ලබාගන්නත් බැරිව යනවා. ඒ නිසයි මේ ධර්මය ප්‍රඥාවන්තයන්ටම පමණක් දැකිය හැකි බව තථාගතයන් වහන්සේ පෙන්වා වදාළේ.

❖ සීලයක් රැක්ක පමණින්, සමාධියක් වැඩුව පමණින්, ධර්මය ඉගෙන ගත්ත පමණින්, වනාන්තරයේ වාසය කරපු පමණින් ජීවිතයේ සත්‍යය කරා ගමන් කරන්න බැහැ. තීක්ෂණ බුද්ධියකින් යුතුව තථාගත ධර්මය තුලින් ජීවිත අභ්‍යන්තර ක්‍රියාවලිය වටහාගන්න පුළුවන් ප්‍රඥාව තියෙන්න ඕනි. ඒ කෙනාටයි නිවන් මාර්ගය විවෘත වන්නේ.

❖ හේතුවල නුවණ තියෙන ජීවිතයේ අභ්‍යන්තර ක්‍රියාවලිය අත්දකින භික්ෂුවකට සීලය රැකීමත්, සමාධිය වැඩීමත්, වනාන්තරයේ වාසය කිරීමත් නිවන්

මග දියුණු කරගෙන සියලු කෙලෙස් නසා දමන්න හරිම පහසුයි. ඒ වුනත් සමාධි සැපයක් ලබාගන්න හැම කෙනාටම අමාරුයි. එවැනි කෙනෙකුට කල්‍යාණ මිතුරන්ගේ ඇසුර තුලින් ධර්මශ්‍රවණයත්, ධර්ම සාකච්ඡාවත් තුලින් හටගන්නා ප්‍රීතිය මුල්කරගෙන විදර්ශනා මාර්ගය තුලට බැසගන්න පුළුවනි. ඒ තුලින් හටගත් සමාධිය නිසා කෙලෙස් දුරු කර දමන්නත් පුළුවනි. ඒ විදියට ජීවත් වන භික්ෂුවට සතුටින් වාසය කරන්න පුළුවනි.

- ඇත්තෙන්ම මේ සංසාර ගමන හරිම භයානකයි. අපමණ දුක් විඳිමින් පුංචි ආශ්වාදයක් ලබමින් මේ සසරේ ගමන් කිරීමේ අර්ථය කිම? මේ සසර ගමනේ ඇති නිස්සාරත්වය දකින කෙනෙකුට නිදහස්වීමටයි කැමැත්ත හටගන්නෙ.

- ගිහි ජීවිතය ගත කිරීමත් ඒ වගේම හරිම පීඩාකාරියි. ගිනිගොඩක ඉන්නවා වගෙයි. නොසන්සිඳුන ආශාවකින් යුතුව අන්ධයන් වගේ නොලැබුණ

මොකක්දෝ ලබාගන්න හොයනවා. කොච්චර වෙහෙසුනත් ඒ දේවල් ලැබෙන්නේ නැහැ.

- පළගැටියා ගින්නට ආශාවෙන් එහි තියන දීප්තියට ඒ ගින්නට පනිනවා වගේමයි මේ ගිහි ජීවිතය තුල හොයන ආශ්වාදය. ඒ ගින්නෙන් පිච්චුනත් පළගැටියා ආයෙමත් ඒ ගින්නෙ තියෙන දීප්තියට නැවත නැවත ගින්නට පනිනවා. ඒ වගේමයි නුවණ නැති අය මේ ගිහි ජීවිතය තුල පිච්චි පිච්චි ආශ්වාදය හොයන්නෙ. සමහරු මේ ගිහි ජීවිතය අතහැරල පැවිදි වුවත්, නිවැරදිව ජීවිතයේ සත්‍යය වටහා නොගත් නිසා පළගැටියා ගින්නට ඇදිලා යනවා වගේ ගිහි ගෙදර තියන ගින්නට පිච්චෙන්න යනවා.

- තථාගත ධර්මය තුලින් ජීවිතේ සත්‍යය අත්දැකපු නැති කෙනා සසරේ ගමන් කරන එක සිදුවෙනවාමයි. නිවැරදි තථාගත ධර්මය ලැබුනත් තමන්ට හිතන්න පුළුවන් හැකියාව නැතිනම් ඔහුට සත්‍ය අත්දකින්න බැහැ. හිතන්න පුළුවන් කෙනාට කළ්‍යාණ මිතුරන්ගේ

ඇසුරින් ජීවිතේ සත්‍යය අසන්න ලැබෙන්නෙ නැතිනම් එයාටත් සත්‍යය අත්දකින්න බැහැ.

- ඒ නිසාමයි පැවිදි වූ කෙනා නැවත ගිහි වෙලා හෝ පැවිදි ජීවිතය ගතකරමින් හෝ සිටියත් සසරින් නිදහස් වීමට නොහැකි වන්නේ.

- මේ තථාගත දහමින් මාත්‍රයක්වත් ඇසුනේ නැති අය ගිහි ගෙදර තියෙන පුහු ආශ්වාදය තුල ජීවත් වන කෙනෙක් කෙසේ නම් සත්‍යය අත්දකින්නද?

- මේ සත්‍යය නිවැරදිව වටහාගත්ත කෙනෙකුගේ මූලිකම ඉලක්කය, මූලිකම උත්සාහය ඒ සත්‍යය කරා ගමන් කිරීමමයි. කුමන සාධාරණ කරුණු ඉදිරිපත් කලත් මේ දහම් මඟ හැසිරෙන්න අමාරුයි කියල, ඒ සියලු අදහස් සැබෑම සත්‍යය නොවෙයි. ඒ සියලුම අදහස් ඇතිවන්නේම තථාගත ධර්මය තමන්ගේ ජීවිතය තුලින් අත්දැකපු නැති නිසා. ඒ නියම සත්‍යය ධර්මය තමන්ට නොතේරෙන නිසා.

❖ ඒ නිසාමයි මේ ධර්මය දැකීම දුෂ්කර, අවබෝධ කිරීම අමාරු, නුවණැත්තන්ට පමණක් ගෝචර වන දෙයක් බව තථාගතයන් වහන්සේ පෙන්වා වදාළේ. කුමන හේතුවක් නිසාද මේ තථාගත ධර්මය අවබෝධ කිරීමට දුෂ්කර වන්නෙ.

❖ සංසාර ගමනේ තියන නිස්සාරත්වය නොදකින, ජීවිත පැවැත්මේ සත්‍යය නොදකින කෙනා මේ ජීවිත පැවැත්ම තුල ආශ්වාදයක් අත්විඳිනවා. අවිද්‍යාව නම් වූ ජීවිතයේ සත්‍යය නොදන්නාකම නිසා මානසිකව ආශ්වාදය විඳින්න ඔහු ලෝකයක් ගොඩනගා ගන්නවා.

❖ ඒ ගොඩනගාගත් ලෝකය තුල ආශ්වාදය විඳින නිසාම ඔහු සත්‍ය හොයන වැඩපිළිවෙලින් ඈත් වෙනවා. ඔහුට ජීවිතේ ආශ්වාදය පිණිස ලෝකයක් ගොඩනගා ගන්නවා. ඒ ලෝකය ඔහුට "දෙයක්" වෙනවා. ඒ කියන්නේ ආශ්වාදය ලබන්න යමක් තියෙනවා කියල ඔහු ගන්නවා.

- මේ ලැබෙන ආශ්වාදය නැති වෙනකොට සසරේ ඇති පීඩාකාරී බව යම් පමණකට වැටහෙන කොට ඔහුට මේ සසරින් නිදහස් වීමට අවශ්‍යතාවක් හටගන්නවා. ඒ සඳහා විවිධ උපක්‍රම යොදනවා. සමහර පිරිස් බොහෝ කාලයක් සැප තියන ලෝක වලට යන වැඩ පිළිවෙලවල් පුරුදු කරනවා.

- සමහර පුණ්‍යවන්ත අයට ඒ විදියට සසරේ ඇති භයානක කම වැටහුන විට ඒ ගමනින් නිදහස් විය හැකි ජීවිතයේ සත්‍යය කියල දෙන කල්‍යාණ මිතුරන්ගේ ඇසුර තුලින් ඒ ධර්මය අසන්න ලැබෙනවා. නමුත් ප්‍රඥාව මදි නිසා ඒ අහපු ධර්මය පවා "දෙයක්" කරගන්නවා.

- ජීවිතයේ සත්‍යය අවබෝධ නොවුන නිසා ආශ්වාදය පිණිස ලෝකය "දෙයක්" කරගත්ත විදියටම සසරින් නිදහස් වන්නට උපකාර වන ධර්මය පවා "දෙයක්" කරගන්නවා. ඊට පස්සේ ඒ "දෙය" කරා ළඟා වීමට උත්සාහ කරනවා. නමුත් ඒ "දෙය" නම් කවදාවත් ලැබෙන්නෙ නැහැ.

❖ තථාගතයන් වහන්සේ පහුරකට උපමා කොට වදාල ධර්මය "දෙයක්" කරගෙන ඒ දෙය හොයනවා. ස්කන්ධ, ආයතන, පටිච්චසමුප්පාද, ධාතු, "දෙයක්" බවට පත්කර ගන්නවා. ඒ වගේම සෝතාපන්න, සකදාගාමී, අනාගාමී, අරහත්වයත් "දෙයක්" කරගන්නවා. ඒ විදියට බහුශ්‍රැත වෙලා අර්ථය හොයන්නෙ නැතිව සත්‍යය අත්දකින්නෙ නැතිව ලැබුණ අවස්ථාව මඟහැරී යනවා.

❖ නමුත් පුණ්‍යවන්ත ප්‍රඥාවන්ත කෙනෙකුට තථාගත ධර්මය කියන කල්‍යාණ මිතුරන්ගෙන් ජීවිතයේ සත්‍ය ධර්මය ඇසෙන විට ඔහු ඒ ධර්මයෙහි අර්ථය හොයනවා. නුවණින් තේරුම් ගන්න මහන්සි ගන්නවා.

❖ ඒ දැනගත් ධර්මය තමා තුලින් විමස විමසා බලනවා. ඒ දැනගත් ධර්මය වචන වලට පමණක් සීමා නොවී තමාගේ ජීවිතය තුලින් අත්දකින්න මහන්සි ගන්නවා. ඔහුට ධර්මය ගැන කියාදුන් පහුරේ උපමාව හොඳට වැටහෙනවා. ඒ ධර්මය "දෙයක්" කරගන්නෙ නැතිව යථාර්තය දකින වැඩපිළිවෙල කරාම ගමන් කරනවා.

එයාට සත්‍ය තමා තුලින් අත්දැකල බොරු පැවැත්ම තුලින් නිදහස් වීමේ හැකියාව තියෙනවා. වෙන කිසිම කෙනෙකුට ඒ හැකියාව නැහැ. කොච්චර ධර්මය ඉගෙන ගත්තද, හොඳට සීලය රැක්කාද, සමාධිය වැඩුවාද, වනාන්තරයේ වාසය කළාද කියන එක නොවෙයි සත්‍ය දකින වැඩපිළිවෙල. සත්‍ය හොයන විමසන හැකියාවෙන් යුතු ප්‍රඥාවමයි ජීවිත අවබෝධය කරා යන මාර්ගය වන්නෙ.

- මේ විදියට තමන් තුලින් ධර්මය දකින කෙනෙක් නැවත කවදා නම් පුහු ආශ්වාදයකට කැමති වී සංසාරේ ගමන් කරන්න උපකාර වන දේවල් සිදු කරයිද? මෙහි ඇති දුෂ්කරත්වය ගැන කියමින් තවත් සාධාරණීකරණය කරමින් ගිහි ගොඩකට වැටෙන දේ සඳහා කරුණු ඉදිරිපත් කරයිද?

- යමෙක් මේ ධර්ම මාර්ගයේ ඇති දුෂ්කරත්වය හෝ අමාරු බව කියමින් සසර තුල සැප විඳිමින් යන ප්‍රතිපදාවකට කැමති වන්නේද පැවිදි කෙනෙක් ගිහි

ගෙදරට කැමති වන්නේද තමා තුලින් සත්‍ය අත්නොදකින නිසාමයි.

❖ ඒ නිසා තමන්ට ලැබුණු මේ උතුම් අවස්ථාවේ ඇති දුර්ලභකම වටහාගෙන අසන්න ලැබුණු ධර්මය "දෙයක්" කරගන්නේ නැතිව පහුරක් බව පමණක් හොඳට සිත තුල දරාගන ඒ ධර්මය තුල තියෙන අර්ථය විමසමින් ඒ සත්‍ය තමන් තුලින් දකින්න මහන්සි ගත යුතුමයි. ඒ කෙනාට නම් කවදා හරි ජීවිතයේ සත්‍ය අත්දකින ධර්ම මාර්ගය විවෘත වෙනවාමයි. ඒ කෙනාට ගිහි ජීවිතයේ ආශ්වාදය ගිනිගොඩක් වගේමයි පේන්නෙ. බොරු රඟපෑමකට ඔහු කැමති වන්නෙත් නැහැ.

❖ ප්‍රඥාවන්ත කෙනෙකුට පුණ්‍ය ශක්තිය නිසා කල්‍යාණ මිතුරන්ගෙන් ජීවිතයේ සත්‍ය හොයන ධර්මය අසන්න ලැබුනාම ඒ ධර්මය "දෙයක්" කරගන්නෙ නැතිව ජීවිතයේ අභ්‍යන්තර ක්‍රියාවලිය හොයමින් බොරු පැවැත්මෙන් නිදහස් වීම පිණිස මාර්ගය පුරුදු කරන්න පුළුවනි. ඒක අභ්‍යන්තර වැඩපිළිවෙලක්. ඒක

බාහිරට ගෝචර දෙයක් නොවෙයි. ඒ නිසා මේ අවස්ථාව මගහරවා ගන්න හොඳ නෑ.

- විපරීත සඤ්ඤාව තුල ජීවත් වෙමින් සසර පැවැත්මම සකස්කරන පුහුදුන් ලෝකයා කුමකින් නම් ආශ්වාදයක් සොයන්නේද?

- පුහුදුන් ලෝකයා මානසික ආශ්වාදයක් තුල සතුටු වන්නේ නිත්‍ය, සුඛ, ආත්ම වශයෙන් ගත් සඤ්ඤාව මත පදනම් වී සංස්කාරයන්හි සත්‍ය ස්වභාවය වටහා නොගන්නා නිසාය.

- සංස්කාරයන්හි සංස්කාර ස්වභාවය නුවණැසින් දක්නහුට විපරීත සඤ්ඤාව මත පදනම් වී ගොඩනගාගත් ලෝකය තුල කිනම් ආශ්වාදයක් දකින්නද?

- සංස්කාරයන්හි සංස්කාර ස්වභාවය නොදන්නාකම නම් අවිද්‍යාව නිසා පුද්ගල සන්තානයකින් තොරව බාහිර ලෝකයේ සංස්කරණයක් තිබේයැයි සිතමින් ඒ

රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අරමුණු තුලින් ආශ්වාදයක් මානසිකව විඳවමින් ජීවිතය ගත කරන්නේ.

❖ සංස්කාරයන්හි සංස්කාර ස්වභාවය විනිවිද දකින ප්‍රඥාවක් ඇති කෙනෙකුට පුහු ආශ්වාදය තුල සාරයක් දැකිය නොහැක්කේමය.

❖ හේතුඵල වශයෙන් ලෝකය සකස්වන හැටි දකින ප්‍රඥාවන්ත කෙනෙකුට ඒ හේතු නිසා ගොඩනැගුනු සංස්කාරයන් හේතු නැතිවීමෙන් නැතිවන බවම පසක් වන නිසා ඒ සංස්කාර කෙසේ නම් නිත්‍ය වශයෙන් බැසගෙන ආශ්වාදය තුල ජීවත් වන්නද?

❖ විනිවිද දකින ප්‍රඥාවක් ඇති තථාගත ශ්‍රාවකයකුට සිහිය එළැඹී සැණින් සංස්කාරයන්හි සංස්කාර ස්වභාවය දකින විට රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අරමුණු වලට සජීවී බවක් ආරෝපණය කරමින් ඒ තුලින් ආශ්වාදයක් කෙසේ නම් ලබන්නද?

❖ සංස්කාරයන්හි සංස්කාර ස්වභාවය විනිවිද ප්‍රඥාව තුලින් දැකීමම ඒ සංස්කාර අනිත්‍ය වශයෙන් දැකීමයි. එසේ සංස්කාරයන්හි සංස්කරණය දකින විට ඒ තුල කෙසේ නම් පිහිටමින් ඒ රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අරමුණු භුක්ති විඳිමින් සැප යැයි ගන්නේද? ඒ තුල වින්දනය කළහැකි සැපක් නොදැකීමමයි සංස්කාරවල දුක් ස්වභාවය ප්‍රඥාව තුලින් දැකීම වන්නේ. සංස්කාර අනිත්‍ය වශයෙන් දකින විට නිමිති නොපිහිටමින් අනිමිත්තයත් ඒ තුල වින්දනයක් ලැබීමට භුක්ති විඳිය හැකි දෙයක් නොදකිමින් සංස්කාරවල දුක්ඛ ස්වභාවය දකින විට අප්පණිහිතයත් විනිවිද දකින ප්‍රඥාව තුලින් ස්පර්ශ වන විට ඒ දහම් ස්වභාවය තුල පුද්ගල ක්‍රියාකාරීත්වයක් කෙසේ නම් දකින්නද? එතනම අනාත්මය පසක් වන විට ශූන්‍යතාවය තුල සිත පිහිටමින් නිවීම පසක් වන මඟ සපුරාලිය හැකි වේ.

❖ මෙලෙස විනිවිද දකින ප්‍රඥාවක් නැතිව සංස්කාරයන් ගොඩනඟන, ඒ ගොඩනඟාගත් සංස්කාර රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අරමුණු වලට සංස්කරණ ස්වභාවය ආරෝපණය කරගනිමින් ඒ රූප, ශබ්ද,

ගන්ධ, රස, පහස, අරමුණු අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් මානසිකව ආරෝපණය කළ පමණින් සංස්කාරයන්හි සංස්කරණ ස්වභාවය වටහාගත නොහැකිය.

- ලෝකය තුළ දැකිය නොහැකි විනිවිද දැකිය හැකි ප්‍රඥාවකින්ම පමණක් දැකිය හැකි මේ සංස්කරණ ක්‍රියාවලිය කෙසේ නම් ලෝකයා දකින්නද? ඒ ක්‍රියාවලියෙන් ඉක්මවූ නිවීම කෙසේ නම් පසක් කරන්නද?

- මේ සිත හරිම වංචනිකයි. තමන් කැමති අරමුණු ඔස්සේම ඇදිලා යනවා. සිහියත් වීරියත් නුවණත් මුල්කරගෙන මේ සිත දමනය කළ යුතුයි. සිහියත් වීරියත් නුවණත් ඇතිවුන විට සිත ප්‍රමුදිත වෙනවා. ඒ ප්‍රමුදිත බව මුල්කරගෙන මේ සිතෙහි ක්‍රියාකාරිත්වය මනාව වටහා ගන්නට පුළුවනි.

- සිත නිතරම කම්මැලිව හැකිලීමෙන් ඉන්න කැමතියි. ඒ වෙලාවට සිහිය පිහිටුවා ගනිමින් වීරියෙන් නුවණින්

යුතුව ධම්මවිචය සම්බොජ්ඣංගයත් විරිය සම්බොජ්ඣංගයත් පීති සම්බොජ්ඣංගයත් වැඩිය යුතුයි. එවිට සංසිඳුන සිතින් යුතුව දහම් මඟ පුරුදු කරන්න පුළුවනි. ඒ වගේම සිත විසුරුණු විට සිහිය පිහිටුවා ගනිමින් වීරියෙන් නුවණින් යුතුව පස්සද්ධි සම්බොජ්ඣංගයත් සමාධි සම්බොජ්ඣංගයත් උපේක්ඛා සම්බොජ්ඣංගයත් වැඩිය යුතුයි. මේ විදියට වඩන විට නිවන් මඟ තුල සතුටින් වාසය කරන්න පුළුවනි.

❖ සිහිය වීරිය නුවණ ඇතිකරගැනීම සඳහා කල්‍යාණ මිතුරන්ගේ ඇසුර නිතරම පවතින්න ඕනි. ඒ විදියට කල්‍යාණ මිතුරාට යොමු වූ සිතක් ඇතිවිට නිවන් මඟට අවශ්‍ය ආහාර ඇතිකරගැනීම හරිම පහසුයි. ඒ නිසාමයි මුළු නිවන් මඟම කල්‍යාණ මිතුරන් මතම පවතින බව තථාගතයන් වහන්සේ පෙන්වා වදාළේ.

❖ නිතරම ප්‍රමුදිත වූ සිතක් ඇතිකරගන්න ඕන. ඒ ප්‍රමුදිත සිත නිසාමයි නිවන් මඟ විවෘත වන්නේ. නමුත් මේ හිත හැම මොහොතේම තමන් කැමතිදේට ඇදිලා යනවා.

මෝහයෙන් යුතු ජීවිතය නිසා රාගයත් ද්වේශයත් නිතරම ඇතිවෙනවා.

- තමන් කැමති දේවල් ලැබෙන විට රාගය ඇතිවෙනවා. ඒ තුලම සිත පවතිනවා. ඒ අවස්ථාවන් වල මේ රාගයෙන් ලැබෙන ආශ්වාදය තුල පවතින සැබෑම තත්වය හොයන්න ඕනි. නිතරම එහි ලැබෙන ආශ්වාදය හිස් දෙයක් බවම කල්පනා කරන්න ඕනි. මොහොතක් ආශ්වාදය විඳලා ඉවර වෙලා යනවා. ඉතින් කුමකට නම් රාගය ඇතිකර ගන්නද? නිතරම හේතුඵල ගැන සොයන කෙනෙකු නම් මේ රාගයෙන් ලැබෙන ආශ්වාදය පසුපසම දුවන්නේ නැහැ.

- ඒ වගේම නිතරම හේතුඵල නුවණින් යුතුව වාසය කරන විට ද්වේශය ඇතිවුන සැණින් ප්‍රහාණය කළ හැකියි. නමුත් ඒ විදියට ප්‍රහාණය නොවී පවතින විට එය දුරු කිරීමට කල්පනා කල යුතුයි. තමන් කැමති දේ ඉටු නොවන විටත් අප්‍රිය දේවල් ලැබෙන විටත් විශේෂයෙන්ම අනුන්ගේ අඩුපාඩු නොදැක අන් අයගේ හොඳම කල්පනා කළ යුතුයි. මේ ලෝකයේ යමෙක්

වැරැද්දක් කරන්නේම රාග ද්වේශ මෝහ නිසාමයි. ඉතින් අනුන්ගේ කෙලෙස් නිසා තමන් කුමක් පිණිසද කෙලෙස් ඇතිකරගන්නේ? මෙය නිතරම සිහි කළ යුතුයි. අනුන්ගේ වැරදි අඩුපාඩු දකින එකම තමන්ගේ පවතින ලොකුම අඩුව වැරැද්ද බව දැකිය යුතුයි. ඒ විදියට කල්පනා කරන විට සිත තුල හටගන්නා තරහා ද්වේශය දුරුවී යනවා.

❖ මේ විදියට නිතරම තමන්ගේ සිතේ ඇතිවන රාග ද්වේශ මෝහ ගැන ප්‍රත්‍යාවේක්ෂා කළ යුතුයි. මේ කෙලෙස් නිසාමයි තමන්ගේ ජීවිතය අපිරිසිදු වන්නේ. ඒ නිසා නිතරම පිරිසිදුභාවයම කැමති විය යුතුයි. ඒ සඳහා සිහිය වීරිය නුවණ ඇතිකරගත යුතුයි. එයට උපකාර පිණිස කළ්‍යාණ මිතුරන් ඇසුරු කළ යුතුයි. කළ්‍යාණ මිතුරන්ට යොමු වූ සිතින් වාසය කළ යුතුයි. එවැනි කෙනෙකුට වරදින්නේම නැහැ.

❖ තාවකාලිකව ලැබෙන පුංචි ආශ්වාදය නිසාම මේ සිත නොමඟ යනවා. කුෂ්ඨය තුල ඇති වේදනාකාරී ස්වභාවය එය කසනවිට මඟහැරී ගොස් ආශ්වාදයක්

ලබනවා. නමුත් පසුව ලැබෙන වේදනාව ඉතාම ප්‍රබලයි. ඒ වගේමයි දහම තුලින් ආශ්වාදයක් නොලබා මේ සිත සොයන ලාමක ආශ්වාදයත්. නමුත් ධර්මයෙන් සතුටු නොවන කෙනා ඒ තාවකාලික ආශ්වාදයට ඇහුවෙනවා. නමුත් ධර්මයම සිතන, ධර්මයම කල්පනා කරන, ධර්මයටම ඇලී ඒ තුලම වාසය කරන භික්ෂුව කවදාවත් ඒ ධර්මය තුලින් පිරිහී යන්නේ නැහැ.

❖ කොනක් නොපෙනෙන සංසාරයේ මෙතෙක් කල් පැමිණියේත්, අවසානයක් නොපෙනෙන සසර ගමනක් තිබෙන්නේත්, ජීවිතයේ සත්‍ය නොදකින නිසා "මම" යන පදනමක් ඇතිකරගෙන ඒ පදනම තුලටම කොටුවෙලා එයම පවත්වන්නට ආශාවෙන් බැඳීයාම නිසයි.

❖ සත්‍ය නොදකින නිසා තමාම කොටුකරගත් රාමුවක ඉඳගෙන සිතුවිලි සිතමින් තව තවත් ඒ තුලටම බැසගනිමින් ඒ රාමුවම පවත්වන්න රාග - ද්වේශ -

මෝහ පෝෂණය කරමිනුයි මෙතුවක් කල් සංසාරයේ ගමන් කලේ.

- යමෙක් ජීවිතයේ සත්‍ය සොයනවා නම්, තමාම හදාගත්ත හිරගෙදර තුල කොටුවෙලා එයින් නිදහස් වීමක් නැතිකම නිසා තිරිසන්, නිරය, ප්‍රේත, මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්ම ලෝක හරහා යන සසර ගමනේ ස්වභාවය වටහාගන්නට පුළුවනි.

- සත්‍ය නොදකින නිසා තමාම කොටුකරගත් හිරගෙදර තුල වාසය කිරීම දුක් සහිත භයානක හිරවීමක්මයි. එයයි සැබෑම හිරගෙදර තුල වාසය කිරීම.

- නමුත් යම් කෙනෙක් මේ සත්‍ය ස්වභාවය ඒ ආකාරයෙන්ම දකිනවා නම් ඔහු සැබෑවටම නිදහස්. ඔහුගේ කය යදම් වලින් බැඳලා හිරකර තිබුණත් සැබෑම නිදහස භුක්ති විඳින්නේ ඔහුයි.

- ජීවිතයේ සත්‍ය නොදකින නිසාම ඔහු තුල පවතින්නේ මෝහයයි. එනම්, තමා කොටුකරගත් රාමුව නිවැරදියි

කියන හැඟීමයි. ඒ වගේම "මම" යැයි ගත් දෘෂ්ඨිය නිවැරදියි කියන හැඟීමයි. ඒ නිසා ඒ රාමුවට ගැලපෙන දේ ඇස, කන, නාසය, දිව, කය, මනසට ලැබෙන විට රාගයත්, නොගැලපෙන දේ ඇස, කන, නාසය, දිව, කය, මනසට ලැබෙන විට ද්වේශයත් හටගන්නවා. නමුත් සත්‍ය දකින විට තමාගේ යැයි කොටුකරගත් රාමුව ඉවත් වුණ විට ( හිරගෙදරින් නිදහස් වූ විට ) තමන්ගේ රාමුවක් නැතිකමම මුලාව නැති වීමයි. ඒ රාමුව නැති නිසා තමාට හොඳ දේ කියා හෝ නරක දේ කියා හෝ මැනීමක් නැත. එතන සැබෑම නිදහසයි.

- "මම" කියල කොටුකරගත් රාමුවමයි දුක වන්නේ. ඒ රාමුව හැදෙන ආකාරය නොදැකීම නිසාම එයින් නිදහස් වීමට නොහැක. ඒ රාමුව හැදෙන ආකාරය දැකීමමයි දුකින් නිදහස් වන මඟ වන්නේ. මේ ආර්ය සත්‍ය ඒ ආකාරයෙන්ම දකින විට ඔහුට සතුටින් වාසය කරන්න පුළුවනි.

❖ තම තමන් කොටුකරගත් රාමුව තුල සිටිද්දීම ලැබෙන දුකින් නිදහස් වන්න උත්සාහ කලාට කවදාවත් නිදහස්විය නොහැක. කොතැනකට ගියත් මොන සැප ලැබුවත් ඒ සියල්ලම තමාගේ කොටු වූ රාමුව තුලම ලබන්නක්. නමුත් සත්‍ය දකිමින් සිටින විට ඔහු කොතැන සිටියත් මොනයම් ආකාරයක සැප-දුක් ලැබුවත් සැබෑම නිදහස ලබන මඟ තුලමයි සිටින්නේ.

❖ මේ නිදහස් වන මඟ අනුගමනය කලහොත් තමන් කොටුවී ඉන්න රාමුව ඉවත් වූ විට මේ භයානක සසර ගමන නවතිනවා.

❖ මේ සත්‍ය වටහා ගැනීම සඳහා මනුසත්භාවයත්, උතුම් වූ බුද්ධ ශාසනයත් ලැබෙන්න ඕන. කල්‍යාණ මිතුරන්ගෙන් ජීවිතේ සත්‍ය සොයන ශ්‍රී සද්ධර්මය අහලා නුවණින් මෙනෙහිකරමින් එය වටහාගෙන ඇස, කන, නාසය, දිව, කය, මනස ඔස්සේ ජීවිතයේ සිදුවන බොරු පැවැත්ම ප්‍රඥාවෙන් දැකීම ධම්මානුධම්ම ප්‍රතිපත්තියයි.

❖ දුර්ලභ මිනිසත් බවයි, උතුම් බුද්ධ ශාසනයයි, කල්‍යාණ මිතුරන්ගෙන් ධර්මය ඇසෙන එකයි ලැබුණු කෙනෙක් මේ උතුම් අවස්ථාව මගහරවාගන්න හොඳ නෑ. උපරිම උත්සාහයෙන් නුවණ මෙහෙයවලා මේ දහම වටහා ගන්නම කාලය කැපකරන්න ඕන. මේ වගේ උතුම් අවස්ථාවක් මගහැරෙන්න දෙන්න හොඳ නෑ. එවිට තම තමන්ගේ ජීවිතය තුලින් සත්‍ය අත්දකින්න පුළුවනි.

❖ යාන-වාහන, ඉඩ-කඩම්, දේපල, දැන උගත්කම්, නම්බුනාම, මිල මුදල් සියලුම දේවල් තමන්ගේ රාමුව තුල ලැබෙන දේවල් විතරයි. අපකීර්ති-අපවාද, දුක දොම්නස මේ සියල්ලත් තමන්ගේ රාමුව තුල තිබෙන දේවල් විතරයි. මේවා භුක්ති විඳිමින් රාග - ද්වේශ - මෝහ වැඩිදියුණු කරගන්නේ තමාගේ හිරගෙදර තුලම වාසය කරන නිසයි. නමුත් සැබෑම නිදහස ලැබූ විට මේ සියල්ලම ප්‍රඥා සහගත උපේක්ෂාවෙන් දකිමින් නොසැලී වාසය කරන්න පුළුවනි. ඒ නිසා මේ ලැබුණු උතුම් අවස්ථාව මගහරවාගන්න හොඳ නෑ.

## නොමිලයේ බෙදා හැරීම පිණිසයි.

නිවුණු පහන් සිල
සමිඳුන් අභියස
කොහේ ගියා දැයි
මඳනළ විමසා...
සොයනු පෙනේ
හේතුව කොතැනද
ඵලයන් එහි බව
නොම දන්නෙද
නුඹ මඳ සුළඟේ...
නොමැති දෙයක් ගැන
ඇතැයි සිතාගෙන
සොයා බැලීමෙන්
පලක් නොවේ.

ඉතින් සුළඟ නුඹ....
වෙහෙසෙනු කුමටද
හටගත් දේ
නුඹ නොම දැක්කේ
හටගත් දේ සොයනු
නුඹහට
ආලෝකය ඉන්
ලැබෙනු ඇතේ
ඉතින් සුළඟ නුඹ ....
ලතැවෙනු කුමටද
බුදු හිමි දෙසූ බණ
වෙනස් නොවේ.

ISBN-978-955-38358-3-3
9 789553 835833

Printed by The Quality Printers 0114 870 333